සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

# තෙවන වාර පරීක්ෂණය - 9 ශ්‍රේණිය - 2019

# Third Term Test - Grade 9 - 2019

නම : .............................................. පෙරදිග සංගීතය කාලය : පැය 02 යි.

වැදගත් :

1. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

## I කොටස

(1) කිසියම් රාගයකට අදාළව ගොඩනගා ඇති ස්වර අභ්‍යාස හඳුන්වන්නේ,

1. පල්ටා නමිනි 2. ස්වර මාලිකා නමිනි 3. සර්ගම් නමිනි. 4. තානාලංකාර නමිනි.

(2) භූපාලි රාගයේ අනුවාදි ස්වර වන්නේ,

1. ග රි ප ස්වරයන් ය. 2. ස රි ධ ස්වරයන් ය. 3. ස රි ප ස්වරයන් ය. 4. රි ප ධ ස්වරයන් ය.

(3) නිර්දේශිත රාග අතරින් ස්වර 2ක් කෝමල වන රාගය,

1. භූපාලි රාගයයි. 2. බිලාවල් රාගයයි. 3. යමන් රාගයයි. 4. කාෆි රාගයයි.

(4) ''සියක් ආයු ලැබ'' ගීතය,

1. උපදේශාත්මක ගීතයකි. 2. ළමා ගීතයකි.
3. මව්ගුණ ගීතයකි. 4. පියගුණ ගීතයකි.

(5) ''දොහොරාව'' යන කොටස ඇතුළත් වන්නේ,

1. ප්‍රශස්ති ගීතවලය. 2. නූර්ති ගීතවලය. 3. නාඩගම් ගීත වලය. 4. වන්නම් වලය.

(6) 'රිගමප, මගමරිස' යන කෙටි ස්වර ඛණ්ඩය අයත් වන්නේ,

1. බිලාවල් රාගයටයි 2. භූපාලි රාගයටයි
3. කාෆි රාගයටයි. 4. මෙම රාග කිසිවකටත් නොවේ.

(7) හින්දුස්ථානි සංගීතයට මේල හෙවත් ථාට 10 හඳුන්වා දුන් සංගීතඥයා වන්නේ,

1. ජග්ජිත් සිං ය. 2. අල්ලා රක්ඛා ඛාන් ය.
3. හරිප්‍රසාද් චෞරසියා ය. 4. විෂ්ණු නාරායන භාත්ඛණ්ඩේ ය.

(8) ශ්‍රී ලංකාවේ මුල්ම ''ගායක කණ්ඩායම්'' දෙක වන්නේ,

1. සමනළයෝ සහ මූන්ස්ටෝන් ය. 2. ත්‍රී සිස්ටර්ස් සහ ලා සිලනියන්ස් ය.
3. ලොස් කැබලෙරොස් සහ ලා සිලනියන්ස් ය. 4. ලා බම්බාස් සහ සුපර් ගෝල්ඩන් චයිම්ස් ය.

(9) සංගීත ප්‍රසංගයක දී භාවිතා කරගනු ලබන තාක්ෂණික මෙවලමක් නොවන්නේ,

1. බෆල්ය 2. මික්සර්ය 3. මයික්‍රොෆෝන්ය 4. එකෝඩියන් ය.

(10) "I Have a dream" යන ප්‍රසිද්ධ ගීතය ගයන ලද්දේ
1. ABBA සංගීත කණ්ඩායමයි.
2. BoneyM සංගීත කණ්ඩායමයි.
3. ධර්මරත්න බ්‍රදර්ස් කණ්ඩායමයි
4. LaBambas සංගීත කණ්ඩායමයි

l **ප්‍රශ්න අංක 11 සිට 15 දක්වා හිස්තැනට අදාළ පිළිතුරු වරහන් තුළින් තෝරා ලියන්න.**
(සර්ගම්, 4/4, නීතීඥ ජෝන් ද සිල්වා, හුණුවටය, ජන ගී ආශ්‍රිත ගීතයකි.

(11) ''වන්නම් සවුදම් ගායන'' ගීතය ........................................................................................ ගීතයකි.

(12) |නි ධ ම|ප ගු රි|ස රි ගු|ම ප-| යනු කාෆි රාගයේ ........................................................................................ ගීතයයි.

(13) හෙළ ගැඹුරයි පුත නොබලන් ........................................................................................ නාට්‍යයේ ගීතයකි.

(14) |ස - ස - |ග - ස ග| යන ප්‍රස්තාර කොටසට ගැළපෙන බටහිර Time Signature වන්නේ ........................................... ය.

(15) නූර්ති හා නාට්‍ය සම්බන්ධ නාමයකි. ........................................................................................

l **ප්‍රශ්න අංක 16 සිට 20 දක්වා ගැළපෙන පිළිතුර යා කරන්න.**

| | | | |
|---|---|---|---|
| (16) | මුඛ්‍යාංගයට ගැළපෙන හින්දි නාමය | - | පකඩ් |
| (17) | වාදි ස්වරයෙන් පසු දෙවන ප්‍රධාන ස්වරය | - | ජප්තාලය |
| (18) | මිශ්‍රමත් කැටි සහිතය | - | කවිකාර මඩුව |
| (19) | සෝබාවදේ මෙපුර | - | සංවාදි |
| (20) | වන්නම් සහ ප්‍රශස්ති සම්බන්ධ ස්ථානය | - | තාරාවෝ ඉගිලෙති |

# II කොටස

**පළමු වැනි ප්‍රශ්නය ඇතුළු ප්‍රශ්න 3 කට පමණක් පිළිතුරු සපයන්න.**

01.

| රාගයේ නම | ආරෝහණ | අවරෝහණ | මුඛ්‍යාංගය |
|---|---|---|---|
| බිලාවල් | ස රි ග ම ප ධ නි ස් | ස් නි ධ ප ම ග රි ස | ------------------------ |
| --------------------- | ------------------- | ස් ධ ප ග රි ස | ග රි ස ධ, ස රි ග, ප ග, ධ ප |
| --------------------- | ස රි ග ම ප ධ නි ස් | | |

(ලකුණු 3)

(i) ඉහත වගුවෙහි හිස්තැන්වලට සුදුසු පිළිතුරු ලියන්න.

(ii) කාෆි රාගයේ මධ්‍යලය ගීතයේ ස්ථායි කොටස ගීත ස්වර ප්‍රස්තාර කර දක්වන්න. (ලකුණු 4)

(iii) බිලාවල්, භූපාලි, කාෆි රාග සඳහා කෙටි ස්වර ඛණ්ඩ එක බැගින් ලියා දක්වන්න. (ලකුණු 3)

02. (i) රජ වාසලේ කවිකාර මඩුව කේන්ද්‍ර කොටගෙන බිහිවූ ගීත වර්ග තුනක් නම් කරන්න. (ලකුණු 3)

(ii) ඔබ ඉගෙනගත් වන්නමක තානම හෝ එක් කවියක පද නියමිත තිතට අනුව පද ප්‍රස්තාර කරන්න.
(ලකුණු 4)

(iii) එම වන්නමේ නාද මාලාව ඇසුරින් නිර්මාණය වූ සරළ ගීතයක් නම් කර එම ගීතය ගායනා කරන ගායකයා හෝ ගායිකාව නම් කරන්න. (ගීතය නම් කිරීම ලකුණු 2)
(ගායකයා/ගායිකාව ලකුණු 1)

03. (i) Key Signature යන්න කෙටියෙන් හඳුන්වන්න. (ලකුණු 2)

(ii) F Major ස්කේලයේ සහ B♭ Major ස්කේලයේ Key Signature යෙදෙන අයුරු ස්ටේව් එකක් මත සටහන් කරන්න. (ලකුණු 4)

(iii) |+ ග ම ප | - ධ ප ම |ම - - ග |ස - - - | යන පෙරදිග ප්‍රස්තාරය බටහිර ක්‍රමයට හරවා ලියන්න.
(ලකුණු 4)

04. (i) ශ්‍රී ලංකාවේ කණ්ඩායම් සංගීතයේ සුවිශේෂී ලක්ෂණ හතරක් නම් කරන්න. (ලකුණු 2)

(ii) ඒ සඳහා භාවිත කළ සංගීත භාණ්ඩ හතරක් නම් කරන්න. (ලකුණු 2)

(iii) ශ්‍රී ලාංකික කණ්ඩායම් සංගීතයේ පුරෝගාමී වූ කණ්ඩායම් තුනක් නම් කර ඒ එක් එක් සංගීත කණ්ඩායමෙන් එළි දැක් වූ ගීත තුනක් නම් කරන්න. (ලකුණු 6)
(කණ්ඩායමට ලකුණු 3, ගීත තුනට ලකුණු 3)

05. (i) ගිටාරයේ හෝ සර්පිනාවේ ඇඟිලි පුවරුවේ දළ රූප සටහනක් ඇඳ ශුද්ධ ස්වර (7) පිහිටන අයුරු දක්වන්න.
(ස්වර 7 ට ලකුණු 7 රූප සටහන ලකුණු 1)

(ii) ඔබ ඇඳ දක්වන ලද භාණ්ඩය භාණ්ඩ වර්ගීකරණයේ දී අයත් වන්නේ කුමන සංගීත ක්‍රමයකටදැයි ලියා දක්වන්න.
(ලකුණු 2)

06. (i) නූර්ති ගී, නාට්‍ය ගී, ජන ගී ආශ්‍රිත සරල ගී යන ගීත වර්ග තුනෙන් එක් ගීත වර්ගයක් පිළිබඳව කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 5)

(ii) ඔබ විස්තර කරනු ලැබූ ගීත වර්ගය හැර අනෙක් ගීත වර්ග දෙකෙන් එක් ගීතයක් මුල් කොටසේ පද මාලාව ලියා දක්වන්න. (ලකුණු 5)

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

## තෙවන වාර පරීක්ෂණය - 9 ශ්‍රේණිය - 2019
## Third Term Test - Grade 9 - 2019

### පෙරදිග සංගීතය - ප්‍රායෝගික පරීක්ෂණය

01. බිලාවල්, කාෆි, භූපාලි යන රාග තුනෙන් එකක ආරෝහණ අවරෝහණ, මධ්‍යලය ගීතය ස්ථායි අන්තරා ගායනා කරන්න.

| | | |
|---|---|---|
| ආරෝහණ | - | 01 |
| අවරෝහණ | - | 01 |
| ස්ථායි | - | 04 |
| අන්තරා | - | 04 |

02. කැමති නාට්‍ය ගීතයක් ගැයීම (ලකුණු 10)

03. කණ්ඩායම් ගීතයක් හෝ ජන ගී ආශ්‍රිත සරල ගීතයක් ගැයීම (ලකුණු 10)

04. ස්වර පුවරුවෙන් කැමති ගීතයක් වාදනය (ලකුණු 10)

05. ගුරුවරයා විසින් නම් කරන මිශ්‍රමත් සහිත තාලයක් (ලකුණු 10)

(මුළු ලකුණු 50)

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

**Answer**

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education

## තෙවන වාර පරීක්ෂණය - 9 ශ්‍රේණිය - 2019
## Third Term Test - Grade 9 - 2019

### පෙරදිග සංගීතය - පිළිතුරු පත්‍රය

### I කොටස

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| (1) | පල්ටා | (2) | සරිප | (3) | කාෆි | (4) | මව්ගුණ |
| (5) | තූර්ති | (6) | බිලාවල් | (7) | විෂ්ණු නාරායන භාත්ඛණ්ඩේ | | |
| (8) | ලොස්කැබලෙරොස්/ලාසිලනියන්ස් | | | (9) | එකෝඩියන් | (10) | ABBA |
| (11) | ජන ගී ආශ්‍රිත ගීතයකි | | | (12) | සර්ගම් | (13) | හුණුවටය |
| (14) | 4/4 | (15) | නීතිඥ ජෝන් ද සිල්වා | | | (16) | පකඩ් |
| (17) | සංවාදි | (18) | ජප්තාලය | (19) | තාරාවෝ ඉගිලෙති | (20) | කවිකාර මඩුව |

(ලකුණු 20)

### II කොටස

01. (i) ග ප ධ නි ස්, භූපාලි, ස රි ග ප ධ ස්, කාෆි, ස් නි ධ ප ම ග රි ස සසරිරිගගමමප (1/2 5 6)
    (ii) මධ්‍යලය ගීතයක් ස්ථායි කොටස (ලකුණු 4)
    (iii) කෙටි ස්වර ඛණ්ඩ තුනක් (ලකුණු 3)

02. (i) ගීත වර්ග තුනක් නම් කිරීම (ලකුණු 3)
    (ii) කැමති වන්නමක් ප්‍රස්තාර කිරීමට (ලකුණු 4)
    (iii) සරල ගීතයක් නම් කිරීම (ලකුණු 2)
    ගායකයා/ගායිකාව නම් කිරීම (ලකුණු 1)

03. (i) Key Signature හැඳින්වීම (ලකුණු 2)
    (ii) F major, B♭ major ලියා දැක්වීම (ලකුණු 4)
    (iii) ප්‍රස්තාරය බටහිර ක්‍රමයට ලිවීම (ලකුණු 4)

04. (i) සුවිශේෂී ලක්ෂණ 4ක් ලිවීම (ලකුණු 2)
    (ii) භාණ්ඩ හතරක් නම් කිරීම (ලකුණු 2)
    (iii) කණ්ඩායම සහ ගීත තුනක් නම් කිරීම (කණ්ඩායමට 3)
    (ගීත තුනට 3)

05. (i) දළ රූප සටහන සහ ස්වර ඇඳ දැක්වීම (රූපසටහන 1, ස්වර 7 ඇඳීම 1)
    (ii) සංගීත සම්ප්‍රදාය (පෙරදිග/අපරදිග) (ලකුණු 2)

06. (i) මාතෘකාවට අදාළ විස්තරය (ලකුණු 5)
    (ii) මුල් කොටසේ පද මාලාව ලියා දැක්වීම (ලකුණු 5)